# Path to Success – Study Pack

## තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## පුරවැසි අධ්‍යාපනය - 11 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

කේ.එල් නිල්මිණි පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )

**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- ගයනි සංදීපා විජේසිංහ - සුභාෂී රාජකීය විද්‍යාලය

සියලු හිමිකම් ඇවිරිණි

## පුරවැසි අධ්‍යාපනය කෙටි සටහන්

## 11 ශ්‍රේණිය- තෙවන වාරය

## හතරවන පාඩම- පාරිසරික ගැටළු හා තිරසාර සංවර්ධනය

1) පරිසරයෙන් ලැබෙන සේවාවන්

| | |
|---|---|
| i. | ජීව උපකාරක සේවා: සොබාදහමින් ලැබෙන හිරු එළිය, වාතය, ජලය වැනි සදාතනික සේවා මෙයට අයත්ය. ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍යම සේවාවන් වේ. |
| ii. | ආර්ථික උපකාරක සේවා: භූමිය, ඛනිජ සම්පත්, දැව, ශාක සත්ව ආහාර, සූර්ය බලය, පොසිල ඉන්ධන, ජල විදුලිය, සුළං බලය යනාදිය අයත් වන අතර මිනිසාගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට මේවා උපකාරි වේ. |
| iii. | අපද්‍රව්‍ය අවශෝෂණ සේවා: මිනිස් හා සත්ව ලෝකයේ විවිධ ක්‍රියාකාරකම් මඟින් පරිසරයට එකතුවන අපද්‍රව්‍ය පරිසරය මඟින් අවශෝෂණය- කරගැනිම මෙමගින් සිදුවේ. |

2) මිනිසා පරිසරය වෙනස් කිරීමට යොමු වීම ආදි මිනිසා තුළ පැවති සරල අවශ්‍යතා හේතුවෙන් පරිසරයට හානියක් නොවිය එහෙත් තාක්ෂණය දියුණුව, නාගරිකරණය, ජන සංඛ්‍යාව වර්ධනය, අවශ්‍යතා සංකීර්ණ වීම මත භෞතික පරිසරයෙන් අසීමිත ලෙස වෙනසට ලක් කිරීමට මිනිසා වර්තමානයේ පෙළඹී ඇත. එහෙයින් පාරිසරික ගැටළු රැසක් උද්ගත වී ඇත.

3) පාරිසරික ගැටලුවක් යනු ස්වභාවික වූ භෞතික පරිසරය විනාශ කිරීමට බලපාන සියලු ආකාරයේ විනාශකාරි තත්වයන් පාරිසරික ගැටලු ලෙස පෙන්වා දිය හැකිය.

4) මිනිසා මුල්වීමෙන් ඇති වී ඇති පාරිසරික ගැටලු පරිසර දූෂණය, වාතය හා ජලය දූෂණය වීම, පසේ සරු බව නැතිවීම, ජෛව විවිධත්වයට හානි පැමිණීම, වසංගත ව්‍යාප්ත වීම. සාගර ජල මට්ටම ඉහළ යාම යනාදි ගැටළු මිනිසා මුල්වීමෙන් ඇතිවී ඇති පාරිසරික ගැටළු උද්ගත වී ඇත. ජල දූෂණය යනු ජලයෙහි ස්වභාවිකව පවත්නා ගුණාත්මකභාවය වෙනස් වීම ජල දූෂණය නම් වේ.

5) ජල දූෂණය යනු ජලයෙහි ස්වභාවිකව පවත්නා ගුණාත්මක භාවය වෙනස් වීම ජල දූෂණය නම් වේ.

- ජලය දූෂණය සිදුවන අවස්ථා

| |
|---|
| 1. කර්මාන්ත මඟින් (නිදසුන්: අපද්‍රව්‍ය ජලයට බැහැර කිරිම) |
| 2. කෘෂි කාර්මික කටයුතු මගින් (පොහොර, වල් නාශක, කෘමිනාශක භාවිතය |
| 3. අම්ල වැසි මඟින්. |
| 4. යාන වාහන සේදීම |
| 5. ස්වභාවික හේතු (ගිනි කඳු, භූමිකම්පා, සුනාමි) |

- ජලය දූෂණය වීමෙන් ඇතිවන ගැටලු

| |
|---|
| 1. ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම |
| 2. ජලජ ජීවින් මියයාම. |
| 3. ජලජ ශාක හා ශාක ප්‍රජාව මියයාම. |
| 4. පාරිසරික සුන්දරත්වය විනාශ වීම. |
| 5. දූෂිත ජලය පානය මඟින් වසංගත රෝග ව්‍යාප්තිය. |

6) වායු දූෂණය යනු: වායුගෝලයේ පැවතිය යුතු සංයුතියේ සිදුවන වෙනස්කම් වායු දූෂණය නම් වේ.

- වායු දූෂණය සිදුවන ක්‍රම

| ස්වභාවික ක්‍රම | කෘත්‍රිම ක්‍රම |
|---|---|
| ගිනි කඳු පිපිරීම | කර්මාන්ත ශාලා මගින් අහිතකර වායු පිට කිරීම. |
| ලැව් ගිනි | වනාන්තර විනාශ කිරීම |
| දූවිලි කුණාටු | ප්‍රවාහන හා ගුවන්යානා මඟින් |

- වායු දූෂණය මඟින් සිදුවන අහිතකර ප්‍රතිඵල

| |
|---|
| ගෝලීය උණුසුම් වීම. |
| ඕසෝන් ස්තරයට හානි පැමිණීම |
| අම්ල වැසි ඇතිවීම. |
| මුහුදු ජල මට්ටම ඉහළ යාම. |
| ලෙඩරෝග ව්‍යාප්ත වීම. |
| දූවිලි වලා ඇතිවීම. |

7) ශිලා ගෝලය යනු කුමක්ද?

පෘථිවියේ පිටත පවතින දැඩි.. පාෂාණ කවරයයි. මෙහි පාෂාණ, ඛනිජ, පස්වලින් සමන්විතය.

- ශිලා ගෝලයට සිදුවී ඇති හානි නිසා ඇතිවන බලපෑම.

| |
|---|
| පරිසර සෞන්දර්යය විනාශ වී යාම. |
| පස නිසරු වීම. |
| ලෙඩ රෝග ව්‍යාප්ත වීම. |
| භූගත ජල මට්ටම අඩුවීම. |
| |

8) වන හායනය යනු කුමක්ද? වන හායනය නිසා සිදුවන අහිතකර ප්‍රතිඵල මොනවාද?

භූමිය තුළ වන වැස්ම ඉවත් කිරීමයි. මේ සඳහා දැව වෙළදාම, මංමාවත් තැනීම, කර්මාන්ත ඉදි කිරීම යනාදිය සඳහා වනාන්තර ඉවත් කරනු ලබයි. ශ්‍රී ලංකාවද 78% වන හායනයට ලක්ව ඇත.

- අහිතකර ප්‍රතිඵල ලෙස

| |
|---|
| ඔක්සිජන් සැපයුමට බාධා පැමිණීම. |
| ගෝලීය උණුසුම වැඩිවීම. |
| කාන්තාරිකරණය වීම |
| පාංශු ඛාදනය වැඩි වීම. |

9) සමාජ පරිසරයට ඇතිවී ඇති බලපෑම හා එමඟින් සිදුවන අහිතකර ප්‍රතිඵල.

සමාජ පරිසරය මිනිසා විසින් නිර්මාණය කරගත් දෙයකි. ගෝලීයකරණය, පවුල් සබඳතා බිඳවැටීම, ආර්ථික ආර්ථික රටාව වෙනස්වීම. මෙහි ඇති වී ඇති වෙනස්කම් වන අතර සමාජ විරෝධි ක්‍රියා

වැඩිවීම, සමාජය දුරාචාර වීම, සමාජ අසාධාරණකම් ඇතිවීම ප්‍රමුඛ වී ඇත.

10) පරිසරය සම්බන්ධ රජයේ වගකීම් හා යුතුකම්

| |
|---|
| සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේදි පාරිසර ප්‍රමිතින් හඳුන්වා දීම. |
| දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් පරිසර හිතකාමී පුරවැසියන් බිහි කිරීම. |
| හරිත ඵලදායිතා සංකල්පය රටට හඳුන්වා දීම. |

11) පරිසරය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම්

| |
|---|
| පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය. |
| නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම. |
| පරිසර නිති-රීතිවලට අනුකූලව කටයුතු කිරීම. |
| සැම විටම පරිසර හිතකාමී ජීවන රටාවක් අනුගමනය කිරීම. |

# සංවර්ධනය

රටක දිළිඳු බව අවසන් වී සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා වැඩි වී ආදායම් බෙදීයාමේ විෂමතාවය ඉවත් වේනම් එය සංවර්ධනයයි.

-ඩඩ්ලි සියර්ස්-

1) සංවර්ධනය මැනීම යනු රටක් අත්පත් කරගෙන ඇති ආර්ථික ප්‍රගතිය හා මට්ටම සලකා බැලීම මේ නම් වෙයි.

2) සංවර්ධනය මැනීමේ පරමාර්ථ

| | |
|---|---|
| • සංවර්ධන විෂමතා හඳුනා ගැනීමට | • ගැටලු වලට විසඳුම් සෙවීමය |
| • ගැටළු අවබෝධ කරගැනීමට | • ආර්ථික ප්‍රතිපත්ති සැකසීමට |
| • රටවල් සමඟ සැසදීමට | |
| | |

3) සංවර්ධන මිනුම්

| සාම්ප්‍රදායික මිනුම් | නූතන මිනුම් |
|---|---|
| දළ ජාතික නිශ්පාදිතය | භෞතික ජීවන තත්ව දර්ශකය |
| ඒක පුද්ගල දළ ජාතික නිශ්පාදිතය | මානව සංවර්ධන දර්ශකය |
| මූර්ත දළ ජාතික නිශ්පාදිතය | දුරකතන ඝනත්වය |
| ආර්ථික වර්ධන වේගය | අන්තර්ජාල භාවිතය |
| | |
| | |

4) දළ ජාතික නිශ්පාදිතය- නිර්ණායක

යම් රටක විදේශිය ශුද්ධ සාධක ආදායම සැලකිල්ලට ගැනිමෙන් පසුව වර්ෂයක් තුළ නිපදවන සියළුම භාණ්ඩ හා සේවාවල එකතු වූ වටිනාකම

| |
|---|
| දළජාතික නිශ්පාදිතය = දළ දේශිය නිශ්පාදිතය + විදේශිය ශුද්ධ සාධක ආදායම |

5) ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය- නිර්ණායක

$$\text{ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය} = \frac{\text{දළ ජාතික නිෂ්පාදිතය}}{\text{මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව}}$$

මෙහි ආර්ථිකමය තොරතුරු පමණක් සලකා බැලෙන අතර සමාජ තත්වය පෙන්නුම් නොකරයි.

6) භෞතික ජීවන තත්ව දර්ශකය- නිර්ණායක

සාක්ෂරතාව, උපතේදි ආයු අපේක්ෂාව, ළදරු මරණ අනුපාතිකය, මෙය සකස් කිරීමේ සංරචක වෙයි. මෙමගින් රටෙහි අධ්‍යාපන, පෝෂණ, සෞඛ්‍ය තත්වයන් විමසා බැලේ.

7) මානව සංවර්ධන දර්ශකය- නිර්ණායක

උපතේදි ආයු අපේක්ෂාව, අධ්‍යාපනය, ක්‍රය ශක්තිය යන නිර්ණායක යොදා ගැනේ. මෙමගින් රටක් ලබාගෙන ඇති සමාජ - ආර්ථික දියුණුව සලකා බැලේ.

8) තිරසාර සංවර්ධනය යනු අනාගත පරපුරෙහි අවශ්‍යතා ඉටුකර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා අහිමි නොකර වර්තමාන- සංවර්ධන ක්‍රියාවලිය පවත්වාගෙන යාමයි.

9) තිරසාර සංවර්ධනය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

| |
|---|
| පරිසර හිතකාමී සම්පත් පරිහරණය. |
| මිහිතලයට දැරිය හැකි සංවර්ධනය |
| ආකල්ප සංවර්ධනය |

සංවර්ධනය අනුව රටවල් වර්ග කිරීම

- සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල්
- සංවර්ධිත රටවල්

සංවර්ධිත රටවල් පහත දැවෙන ලක්ෂණවලින් සමන්විත ය.

| | |
|---|---|
| භෞතික ජීවන තත්ව දර්ශකය 90 ඉක්මවයි | මානව සංවර්ධන දර්ශකය ඉහළ ය. |
| ප්‍රතිශීර්ෂ ආදායම ඇමරිකන් ඩොලර් 3500 ඉක්මවයි. | ජන සංඛ්‍යා වර්ධන වේගය අඩු ය. |
| ඉහළ සාක්ෂරතාවයක් පවතී. | උපතේ දී ආයු අපේක්ෂාව ඉහළය. |
| ඉහළ ඒක පුද්ගල කැළරි පරිභෝජනය. | ළදරු මරණ අනුපාතය අඩුය. |
| නාගරික ජන සංඛ්‍යාව වැඩිය. | ප්‍රාග්ධන සම්පත් වැඩිය. |
| තාක්ෂණය ඉහළ මට්ටමක පවතී | දළ දේශීය නිශ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය ඉහළ ය. |
| දළ දේශීය නිශ්පාදිතයෙන් කරන අධ්‍යාපන වියදම ඉහළ ය. | |

10) තිරසාර සංවර්ධනයේ පුරවැසි යුතුකම්

| |
|---|
| අධි පරිභෝජනයෙන් වැලකීම. |
| නිති රීතිවලට අනුගත වීම. |
| සම්පත් අරපිරිමැස්ම. |
| පරිසර හිතකාමී ආකල්ප වර්ධනය. |

11) තිරසාර සංවර්ධනයේ රජයේ යුතුකම්

| |
|---|
| i. පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. |
| ii. පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිශ්පාදකයන් දිරි ගැන්වීම. |
| iii. පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම. |
| iv. පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව යොමු කරවීම. |

12) සංවර්ධිත රටවල් මුහුණ පාන ගැටලු

| |
|---|
| ජාත්‍යන්තර ත්‍රස්තවාදය |
| පරිසර දූෂණය |
| අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාව. |
| නිමි භාණ්ඩ අලෙවි කර ගැනීමේ දුෂ්කරතා. |
| බලශක්තිය පිළිබඳ ව ඇති ගැටලු. |
| වෙළඳ පොළ සඳහා ඇති තරඟය. |
| |
| |
| |
| |

13) සංවර්ධනය වෙමින් පවතින රටවලට බලපාන ගැටලු

| |
|---|
| • ප්‍රාග්ධන හිඟය |
| • අවාසි දායක වෙළඳ ශේෂය |
| • විදේශ විනිමය හිඟය |
| • ත්‍රස්තවාදය |
| • යැපෙන්නන් සංඛ්‍යාව වැඩි වීම. |
| • ප්‍රාථමික භාණ්ඩවල මිල උච්චාවචනය. |
| • තාක්ෂණික දැනුම අඩුවීම. |
| • දේශපාලන අස්ථාවර බව. |
| • ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළ අගයක් ගැනීම. |
| • අපරාධ, දූරාචාරය, මානව හිමිකම් කඩවීම, මත්ද්‍රව්‍ය වැනි සමාජ සාපරාධි ක්‍රියා වැඩිවීම. |
| • දේශීය සම්පත්වල හිමිකම් විදේශයන් විසින් උදුරා ගැනීම. |
| • විරැකියාව |

14) සංවර්ධනය වෙමින් පවතින රටවලට උදාහරණ

| | |
|---|---|
| ඉතියෝපියාව | ඉන්දියාව |
| සෝමාලියාව | ශ්‍රී ලංකාව |
| සියොරා ලියොන් | නේපාලය |
| ගිනි බිසව් | බංග්ලාදේශය |

15) සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට විශේෂිත ගැටලු

| |
|---|
| ප්‍රාග්ධන ඌණතාව |
| ආනයනය කරන භාණ්ඩ සඳහා ඉහල මිලක් ගෙවීමට සිදුවීම. |
| අවාසි දායක වෙළඳ ශේෂය |
| |
| |

16) සංවර්ධනය වෙමින් පවතින රටවල ලක්ෂණ

| | |
|---|---|
| ළදරු මරණ අනුපාතය ඉහළය | භෞතික ජීවන තත්ව දර්ශකය පහළ ය |
| සාක්ෂරතාව පහළය | මානව සංවර්ධන දර්ශකය පහළය. |
| අඩු ඒක පුද්ගල ආදායම | අඩු ඒක පුද්ගල කැළරි පරිභෝජනය. |
| ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩි ය. | ප්‍රාථමික භාණ්ඩ අපනයනය නිසා විදේශ විනිමය ඉපැයීම් අඩු ය. |
| තාක්ෂණ ඌණතාවය | එක වෛද්‍යවරයෙකුට සිටින රෝගීන් සංඛ්‍යාව ඉහළ ය. |

හතරවන පාඩම- පාරිසරික ගැටළු හා තිරසාර සංවර්ධනය

ලකුණු 02 ප්‍රශ්නය

| |
|---|
| 01. ස්වභාවික පරිසරයට අයත් සංසිද්ධීන් 02ක් නම් කරන්න. |
| 02. වනාන්තර (වන) හායනයට බලපාන හේතු 02 ක් නම් කරන්න. |
| 03. රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ 02ක් නම් කරන්න. |
| 04. සංවර්ධනය වන රටවල් මුහුණපාන ගැටළු 02 ක් නම් කරන්න |
| 05. වායු දූෂණය මඟින් ඇතිවන අහිතකර ප්‍රතිඵල මොනවාද? |
| 06. ස්වභාවික පරිසරයට අයත් ද්‍රව්‍යය... 02ක් ලියන්න. |
| 07. පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන ස්වභාවික හේතු 2 ලියන්න. |
| 08. සංවර්ධනය මැනීම සිදුකරන නූතන මිනුම් 02 ක් නම් කරන්න. |

ලකුණු 03 ප්‍රශ්නය

| |
|---|
| 01. පරිසරයෙන් අපට ලැබෙන සේවාවන් 03ක් ලියන්න. |
| 02. වන හායනය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 03 ක් ලියන්න. |
| 03. වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 03 ක් ලියන්න |
| 04. පරිසරය සුරැකීම සඳහා පුරවැසියකු විසින් ඉටුකල යුතු යුතුකම් 03 ලියන්න. |
| 05. සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන සාම්ප්‍රදායක මිනුම් 03 ලියන්න. |
| 06. සංවර්ධනය වන රටවල ලක්ෂණ 03 නම් කරන්න. |
| 07. සංවර්ධිත රටවල් මුහුණපාන ගැටළු 03 නම් කරන්න. |
| 08. පරිසරයෙන් ලැබෙන සේවාවන් 03 නම් කරන්න. |

පස්වන පාඩම- ජාත්‍යන්තර සබඳතා

ලකුණු 02 ප්‍රශ්නය

| |
|---|
| 01. ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ස්වරූප 2 නම් කරන්න. |
| 02. කලාපීය සංවිධාන ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණු 2 නම් කරන්න. |
| 03. සාර්ක් (SAARC) සංවිධානයට අයත් සාමාජික රටවල් 2 ලියන්න |
| 04. ජාත්‍යන්තර වෙළඳාම සිදුකරන ප්‍රධාන ආකාර 2 නම් කරන්න. |
| 05. ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා වන ප්‍රබල මුදල් වර්ග 2 නම් කරන්න. |
| 06. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් අනුබද්ධ ආයතන 2 නම් කරන්න. |
| 07. ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල 02 ලියන්න. |
| 08. සාර්ක් (SAARC) සංවිධානය ඇතිකරගත වෙළඳ ගිවිසුම් 02 නම් කරන්න. |

ලකුණු 03 ප්රශ්නය

| |
|---|
| 01. විදේශ ආධාර ලබාදෙන ප්‍රධාන ක්‍රම 3 නම් කරන්න. |
| 02. ජාත්‍යන්තර සබඳතා පැවැත්වීම මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු 3 නම් කරන්න. |
| 03. සාර්ක් (SAARC) සංවිධානය පිහිටුවීමේ අරමුණු 03 ලියන්න. |
| 04. ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමට බලපාන සාධක 03 ලියන්න. |
| 05. එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කිරීමේ අරමුණු 03 ලියන්න. |
| 06. තානාපතිවරයකුගේ කාර්යය භාරයන් 03ක් ලියන්න. |
| 07. පොදු රාජ්‍ය මණ්ඩලය පිහිටුවා ගැනිමේ අරමුණු 03 ලියන්න. |
| 08. ජාත්‍යන්තර සබඳතා ලොව මුල්කාලිනව ගොඩනැගීමට හේතු වූ කරුණු 03 ලියන්න. |

ජාත්‍යන්තර සම්බන්ධතා

පුරවැසි අධ්‍යාපනය

05 වන පාඩම

1) ජාත්‍යන්තර සම්බන්ධතා යනු

රාජ්‍ය දෙකක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් අතර පවත්නා සියලුම- ආකාරයේ සබඳතාවයන්ය.

2) ජාත්‍යන්තර සම්බන්ධතා ලොව මුල්කාලිනව ගොඩ නැඟීමට හේතු වූ කරුණු

ජනගහනය වර්ධනය, මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම නිසා එම අවශ්‍යතා සපුරාගැනීමේ මාර්ග වැඩි දියුණු කිරීම, රටවල් අතර සහයෝගය තුළින් සංවර්ධන ඉලක්ක කරා යාම අවශ්‍ය බැවින් ජාත්‍යන්තර සබඳතා ගොඩනැගිනි.

3) ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු.

| |
|---|
| තම රාජ්‍යයට තනිව සපුරා ගත නොහැකි යම් දෙයක් වේ නම් ඒවා සපුරා ගැනිම. |
| දේශපාලන- ආර්ථික- සංස්කෘතික- සමාජ සබඳතා පුළුල් කර ගැනීම. |
| ප්‍රබල රාජ්‍ය වලින් ඇතිකරන බලපෑම්වලින් ආරක් ෂා වීමට. |

4) ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප 02

| |
|---|
| රාජ්‍ය උපාය සබඳතා - රාජ්‍යයන් අතර ඇතිකරගනු ලබන සාමකාමී සබඳතා වන අතර මේවා රාජ්‍ය දූතයන්, තානාපතිවරු හරහා නිල මට්ටමින් ගොඩනඟා ගනී. |
| යුධ උපාය සබඳතා - යුධමය වශයෙන් රාජ්‍ය අතර ගොඩනඟා ගන්නා සබඳතා වේ. |

5) වර්තමානයේ ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වී ඇති විවිධ ක්ෂේත්‍ර

| | |
|---|---|
| වෙළඳාම | සංස්කෘතික |
| අධ්‍යාපනික | සන්නිවේදන |
| ප්‍රවාහනය | |

6) ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමෙහිලා බලපෑ සාධක.

| |
|---|
| සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස්කම්. නිදසුන්: මැදපෙරදිග රටවල ඛනිජ තෙල් පැවතීම |
| අවශ්‍ය සියල්ල රට තුළ නිපදවා ගත නොහැකි වීම. |
| අතිරික්ත නිශ්පාදන අලෙවි කර ගැනීම. |
| ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව. |
| දියුණු තාක්ෂණය ලබාගැනීමේ අවශ්‍යතාවය. |
| හදිසි ආපදා හා වෙනත් විපත් අවස්ථා තුළ සහය ලබා ගැනිම. |

7) ජාත්‍යන්තර සබඳතා තුළ ශ්‍රී ලංකාවට කරන බලපෑම.

ජාත්‍යන්තර වෙළඳාම, ණය හා ආධාර, ජාතික ආරක්ෂාව, රැකියා සැපයීම යන අංශ වලදී බොහෝ රටවල් යහපත් මිත්‍ර සහයෝගිතා ගෙන යන්නා සේම දැඩි නීති කොන්දේසි පනවනු ලබන රටවල්ද පවතී.

8) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන මාධ්‍ය.

- තානාපති සේවය

රාජ්‍ය අතර සාමකාමී සබඳතා පවත්වාගෙන යනු ලබන්නේ තානාපති සේවය හරහාය. රටක විදේශ ප්‍රතිපත්තිය ශක්තිමත්ව පවත්වා ගැනීමට මෙය ඉවහල් වෙයි.

තානාපතිවරුන්ගේ කාර්යය භාරය

| |
|---|
| 01. තම රටේ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම. |
| 02. තම රට පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම. |
| 03. රාජ්‍ය අතර මිත්‍රත්වය වැඩිදියුණු කිරීම. |

- ජාත්‍යන්තර වෙළඳාම

මෙය ප්‍රධාන කොටස් 2කි.

i. ද්විපාර්ශවික වෙළඳාම- රටවල් දෙකක් අතර සිදුවන වෙළඳ ගනුදෙනු

ii. බහුපාර්ශවික වෙළඳාම- රටවල් 2කට වඩා වැඩි ගණනක් අතර සිදුවන වෙළඳාමය.

ජාත්‍යන්තර වෙළඳාම තුළ යුරෝ, ජපන් යෙන්, ඇමෙරිකානු ඩොලර්, ස්ටර්ලින් පවුම් ප්‍රබල ලෙස භාවිතා වන මුදල් ඒකක වේ.

- විදේශාධාර

විදේශාධාර සැපයීම සඳහා ජාත්‍යන්තර සබඳතා ශක්තිමත්ව පැවතිම අවශ්‍ය වේ. සංවර්ධනය වන රටවල මහා පරිමාණ බැර කර්මාන්ත, යටිතල පහසුකම්, ආර්ථික අංශවල දියුණුව වෙනුවෙන් ආධාර ලබාදෙයි. මෙම විදේශ ආධාර පරිත්‍යාග, ණය, භාණ්ඩ හා සේවා ලෙස ලබා දෙන අතර ඇමෙරිකාව, ජපානය, චීනය, ආධාර ලබාදෙන රටවල් අතර ප්‍රමුඛ වෙයි.

9) ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනිමෙන් අත්වන ප්‍රතිඵල.

| |
|---|
| ජාත්‍යන්තර සුහදත්වය වර්ධනය වීම. |
| නව රැකියා අවස්ථා උදා වීම. |
| නව තාක්ෂණ දැනුම හුවමාරුව. |

❖ කලාපීය සංවිධානයක් යනු -

ලෝකයේ දක්නට ලැබෙන භූගෝලීය කලාප පදනම් කරගෙන බිහි වී ඇති සංවිධාන වේ. මෙම කලාපීය සංවිධාන යුධමය හා ආර්ථික සහයෝගිතාව පදනම් කරගෙන පිහිටුවා ගෙන ඇත.

1) සාර්ක් සංවිධානය

දකුණු ආසියාතික කලාපයට අයත් රටවල් එක්ව පිහිටුවාගෙන ඇති සංවිධානය (SAARC) .

- රටවල්- ඉංදියාව, ශ්‍රී ලංකාව, පාකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය, භූතානය, මාලදිවයින, ඇෆ්ගනිස්ථානය යන රටවල් සාමාජික රටවල් වේ.
- අරමුණු-
  i. දකුණු ආසියාතික කලාපයේ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම.
  ii. සහයෝගිතාව වර්ධනය කරගැනීම.
  iii. කලාපය තුළ ආර්ථික, සමාජ, සංස්කෘතික සංවර්ධනය වේගවත් කිරීම.
- වර්තමාන තත්ත්වය-

  සංවර්ධනය වෙමින් පවතින රටවල්ය. මත්ද්‍රව්‍ය උවදුර, ත්‍රස්ත්‍රවාදි ගැටුම්, රාජ්‍ය තාන්ත්‍රික විරසක බව, මෙම රටවල් මුහුණදෙන අවස්ථා වේ.
  - SAPATA- දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම්
  - SAFATA- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම්

  සාර්ක් සංවිධානය ඇතිකරගත් වෙළඳ ගිවිසුම් වේ.

2) ආසියන් සංවිධානය

ඉන්දුනිසියාව, තායිලන්තය, පිලිපීනය, මැලේසියාව, වියට්නාමය, මියන්මාරය, ලාඕසය, සිංගප්පූරුව, බෲනායි යන රටවල් සාමාජිකය. මෙම සංවිධානයේ

- අරමුණ - වෙළඳ ගනුදෙනු හා ආර්ථික සහයෝගිතාව ඇතිකර ගැනීමය.

3) කොළඹ ක්‍රමය (Colombo Plan)

දකුණු හා අග්නිදිග ආසියාතික රටවල තම රටවල ආර්ථික සමාජ දියුණුව සඳහා ඇතිකරගත් සාමුහික සැලැස්මයි. මේ සඳහා J. R. ජයවර්ධන මැතිතුමා, සර් පර්සි ස්පෙන්ඩර් මූලිකත්වය ගත්තා ලදී.

- සාමාජික රටවල්- ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය, කැනඩාව, නවසීලන්තය, මියන්මාරය, ජපානය, මාලදිවයින යනාදී සාමාජික රටවල් 27කි.

4) බිම්ස්ටෙක් (BIMST-EC) සංවිධානය

මෙහි ආර්ථික සහයෝගි බව හා තාක්ෂණික දැනුම හුවමාරුව අරමුණු විය.

- සාමාජික රටවල්:

B- බංග්ලාදේශය, I- ඉන්දියාව, M- මියන්මාරය, S- ශ්‍රී ලංකාව, T- තායිලන්තය.

❖ ජාත්‍යන්තර සංවිධාන

රටවල් කීපයක් එකතු වී පොදු අවශ්‍යතා ඉටුකර ගැනීම වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන පිහිටුවා ගත් අතර ඒ අතුරින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රමුඛ වෙයි.

1) එක්සත් ජාතින්ගේ සංවිධාන ව්‍යුහය.

| | |
|---|---|
| 01. මහා මණ්ඩලය | 04. ලේකම් කාර්යාලය |
| 02. ආර්ථික හා සමාජ මණ්ඩලය | 05. ජාත්‍යන්තර අධිකරණය |
| 03. භාරකාර මණ්ඩලය | 06. ආරක්ෂක මණ්ඩලය |

- එක්සත් ජාතින්ගේ සංවිධානයේ අරමුණු

| |
|---|
| ලෝක සාමය පවත්වාගෙන යාම. |
| ජාතින් අතර සබඳතා වර්ධනය කිරීම. |
| මානව අයිතීන් සුරක්ෂිත කිරීම. |

- එක්සත් ජාතින්ගේ සංවිධානයට අයත් අනුබද්ධ ආයතන

| |
|---|
| 1. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) |
| 2. එක්සත් ජාතින්ගේ ළමා අරමුදල (UNICEF) |
| 3. අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF) |
| 4. ලෝක ආහාර වැඩසටහන (WFP) |
| 5. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) |

2) පොදු රාජ්‍ය මණ්ඩලය

2 වන ලෝක යුද්ධය අවසන් කාලය තුළ බ්‍රිතාන්‍ය යටත් විජිත රටවල් බොහෝමයකට, නිදහස හිමි විය. එවන් රටවල් එක්ව පිහිටුවා ගත් සංවිධානය වන අතර මෙහි නායකයා වන්නේ රජු හෝ රැජිණ වේ.

- සාමාජික රටවල්- මහා බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, නවසීලන්තය, ඉන්දියාව, දකුණු අප්‍රිකාව.
- අරමුණු

| |
|---|
| 01. අන්තර් ජාතික සාමය පවත්වා ගෙන යාම. |
| 02. දිළිඳුකම, නූගත්කම, ලෙඩ රෝග තුරන් කිරීම. |
| 03. සියළු පුරවැසියන්ගේ නිදහස, අයිතිවාසිකම් ආරක්ෂා කරදීම. |